052886
2015.07.20
ML/PR
D- 817

# ශ්‍රී ලාංකේය ආලේඛ්‍ය චිත්‍ර කලාව

(19 වැනි සියවසේ සිට 20 වැනි සියවස දක්වා)

2013

මෙම නිබන්ධය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ, පශ්චාද් උපාධි පීඨයේ දර්ශනපති උපාධි පර්යේෂණ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරේ.

ජේ. ඒ. එස්. පී. අරවින්දන
**GS/ Mphil/ VA09/ 505**
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# සංක්ෂේපය

මෙම පර්යේෂණයෙන් මූලික ව ම විමර්ශනයට ලක් කරනු ලැබුවේ ශ්‍රී ලංකාව තුළ ශාස්ත්‍රාලයීය ආලේඛ්‍ය චිත්‍ර කලාව ස්ථාපිත වීම සහ එහි විකාශය සිදු වූයේ කෙසේ ද යන්න යි. මේ සඳහා ලාංකේය ශිල්පි නියැදිය ලෙස ජේ. සී. ජී. එස්. අමරසේකර, ටියුඩර් රාජපක්ෂ, ජේ. ඩී. ඒ. පෙරේරා, ඩේවිඩ් පේන්ටර් සහ ස්ටැන්ලි අබේසිංහ යන ආලේඛ්‍ය ශිල්පී සාමූහිකය මූලික වශයෙන් තෝරා ගැනුණි. 20 වැනි සියවස කේන්ද්‍රීය ව මෙම අධ්‍යයනයට තෝරා ගත් ලාංකේය ශිල්පී සමූහය ආලේඛ්‍ය චිත්‍ර කලාවේ විවිධ අවධි සහ සම්ප්‍රදායයන් කිහිපයක් නියෝජනය කරති.

ශ්‍රී ලාංකේය යථාර්ථවාදී ආලේඛ්‍ය චිත්‍ර කලාව ස්ථාපිත වන්නේ යුරෝපීය බලපෑම හේතු කොට ගෙන බව මෙම පර්යේෂණයේ දී පෙනී ගිය අතර බ්‍රිතාන්‍ය ශාස්ත්‍රාලයීය චිත්‍ර සම්ප්‍රදාය ශ්‍රී ලාංකේය නූතන යථාර්ථවාදී ආලේඛ්‍ය කලාව සකස්වීමට තීරණාත්මක ව බලපාන ලද බව පෙනෙයි. ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී ලක්ෂණ වැඩිපුර අනුකරණය කළ ශිල්පියා වන්නේ අමරසේකර වන අතර ඔහු අන්ධානුකරණයෙන් ශාස්ත්‍රාලයීය චිත්‍ර කලාව වැළඳ ගෙන තිබීම දුබලතාවකි. කෙසේ වුව ද ශාස්ත්‍රාලයීය ආලේඛ්‍ය චිත්‍රය, කලා මාධ්‍යයක් වශයෙන් ලංකාව තුළ ජනප්‍රිය කරවීමට අමරසේකර පුරෝගාමී විය. ටියුඩර් රාජපක්ෂ, අමරසේකර මෙන් ශාස්ත්‍රාලයීය රීතිය මත ම රඳා නොසිටි අතර ඔහු එය වඩා නිදහස් ස්වරූපයකින් හසුරුවා තිබේ. රාජපක්ෂගේ ආලේඛ්‍ය චිත්‍රවල පුද්ගල අනන්‍යතාවන් ප්‍රබල ව හුවා දැක්වීමට වඩා සමාජ පරිවර්තන මාලාවන්ට පුද්ගල රූප දක්වන ප්‍රතික්‍රියා අවධාරණයට වැඩි නැඹුරුවක් දක්වා තිබේ.

පර්යේෂණට යොදා ගත් ශිල්පීන් අතුරින් ආලේඛ්‍ය චිත්‍ර කලාව ගැඹුරු, සාධනීය හා උසස් කලාත්මක මාධ්‍යයක් වශයෙන් තහවුරු කිරීමට හේතු වූ ශිල්පීන් වශයෙන් ජේ. ඩී. ඒ. පෙරේරා, ඩේවිඩ් පේන්ටර් සහ ස්ටැන්ලි අබේසිංහ හැඳින්විය හැකි ය. මේ ශිල්පීන් තිදෙනා ම ශාස්ත්‍රාලයීය යථාර්ථවාදය පිළිබඳ ව මනා දැනුමක් සහිත ශිල්පීන් වුව ද ඔවුන් ශාස්ත්‍රාලයීය යථාර්ථවාදයේ හුදු අනුකාරකවාදීන් නො වී තමන්ට ආවේණික ශිල්පීය ක්‍රමවේදයන්ට අනුව එය පාලනය කොට දක්ෂ ලෙස භාවිත කර තිබේ. ජේ. ඩී. ඒ. පෙරේරා යථාර්ථවාදී ලක්ෂණ මෙන් ම උපස්ථිතිවාදය වැනි නූතන කලා ප්‍රවාහයන්වල ද ආභාසය ලබා නිර්මාණකරණයේ යෙදුණු අතර පුද්ගල ආලේඛ්‍යවල විවිධත්වයට අනුරූප ව ශිල්පක්‍රම භාවිත කරමින් බාහිර චරිත ස්වභාවය මෙන් ම අභ්‍යන්තර චරිත ස්වභාවය මතු කිරීමට ඇති හැකියාව ඔහුගේ චිත්‍රවල ප්‍රමුඛ ලක්ෂණයකි.

ශාස්ත්‍රාලයීය කලාව විධිමත් ව ප්‍රගුණ කළ ඩේවිඩ් පේන්ටර් ශාස්ත්‍රාලයීය කලාව දේශීය පරිසරයට අනුරූප ව දක්ෂ ලෙස ගළපා ගෙන නව භාවිතයක් බවට පත් කරන ලදී. ස්ටැන්ලි අබේසිංහ විසින් පේන්ටර් සහ ජේ. ඩී. ඒ පෙරේරා දියුණු කළ ලාංකේය ආලේඛ්‍ය නව මානයක් ඔස්සේ තව දුරටත් ඉදිරියට වර්ධනය කරන ලදී. අබේසිංහ ශාස්ත්‍රාලයීය මෙන් ම නූතනවාදී කලා ප්‍රවාහයේ ද ආභාසය ලබමින් ආලේඛ්‍යකරණය වඩාත් ඉදිරියට ගෙන

ආ අතර වරෙක වේගවත් ව ද තවත් වරෙක මන්දගාමී ව ද ආලේඛ්‍යවල විවිධ කොටස් ඒවාට අනුගත රිද්මයකින් ප්‍රතිනිර්මාණය කරන ලදී. මේ අනුව ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී ආලේඛ්‍ය චිත්‍ර කලාවේ ක්‍රමික හා පැහැදිලි සංවර්ධනාත්මක විකාශ අවස්ථා කිහිපයක් අමරසේකරගේ සිට අබේසිංහ දක්වා ආලේඛ්‍ය චිත්‍ර කලාව විමසීමේ දී හඳුනා ගැනීමට හැකි ය. අමරසේකර විසින් ආරම්භ කරන ලද අනුකරණවාදී ස්වභාවය ටියුඩර් රාජපක්ෂ, ජේ. ඩී. ඒ පෙරේරා, ඩේවිඩ් පේන්ටර් සහ ස්ටැන්ලි අබේසිංහ හරහා කලාත්මක සහ නූතනවාදී කලාවේ ද ආභාසයන් සහිත ව සාධනීය වශයෙන් ඉහළට පැමිණීම සිදු විය.